# නොමිලයේ දෙන සියල්ල
# ඇතුලත් රක්ෂණ සහතිකය



# නොමිලයේ දෙන සියල්ල ඇතුලත් රක්ෂණ සහතිකය




- සෞඛ්‍යය
- නිවාස
- ගිනි
- ජීවිත

## සුභාරංචි රක්ෂණය

### සෞඛ්‍යය

අද වෛද්‍ය සේවාවන් ලබාගැනීම සඳහා වන වියදම් දැවැන්ත වේ . සෞඛ්‍ය රක්ෂණය සඳහා වන පිරිවැයද එලෙසමය. ඔබගේ සියලුම රෝග සුවකලහැකියයි පවසන වෛද්‍යවරයෙක් ඔබට හමුවී තිබේද?

“එහෙත් එතුමන් තුවාළ ලැබුවේ අපේ අපරාධ නිසා ය පොඩි කරනු ලැබුවේ අපේ පව් නිසා ය. එතුමන් ලත් දඬුවමින් අපට සාමදානය ලැබී ඇත එතුමන් ලැබූ පහරවලින් අපට සුවය ලැබී ඇත.”(යෙසායා 53:5)

### නිවාස

නිවාස හිමියන් සියලු ආකාර හානි සොරකම් සහ අනවසර ඇතුල්වීම් වලින් තම නිවෙස්

ආරක්ෂාකරගැනීමට රක්ෂණ සහතික ගෙන
ඇත. කෙසේවුවත් දොරජනේල්වල
යකඩ පොලු තිබීම
ගෙවල්බිඳීමේ අනතුරුහැඟවීම්
සවිකරතිබිම හෝ මුරසංචාර
පවත්වාගෙනයාම නිවාස
හිමියන්ට සුරක්ෂිතභාවයක් හෝ
සිතේ සාමයක් ගෙනනොදේ.



“ඔබේ සිත් නොකැළඹේ වා!
දෙවියන් වහන්සේ අදහාගන්න මා ද අදහාගන්න. මාගේ
පියාණන් වහන්සේගේ නිවාසයෙහි වාසය කිරීමට
ඉඩපහසු තැන් බොහෝ ඇත. එසේ නොවේ නම් ඒ බව
මම ඔබට නොකියම් ද ඔබට ස්ථානයක් සූදානම් කරන
පිණිස යමි.” (යොහාන් 14:1,2)

## ගිනි

ගින්න නිවෙස් සහ අනර්ඝ වස්තූන් දවා දමයි,
සමහර දේ නැවත ලබාගැනීමට නොහැකිය. එහෙත්,
සදාකාලයේ, සදාතනික ගින්නක් ඇත. එම ගින්නෙන්
ඔබව ආරක්ෂා කිරීමට ඔබට ක්‍රමයක් තිබේද?

“ජයගන්නා මේ දේවල්
උරුමකරගන්නේය. මම ඔහුගේ





දෙවියන් වහන්සේ වන්නෙමි. ඔහු
මාගේ පුත්‍රයා වන්නේය.
එහෙත් බියසුල්ලෝ ද අවිශ්වාසිකයෝ
ද දුරාචාරීහු ද මිනී මරන්නෝ
ද කාමමිථ්‍යාචාරීහු ද අනවින
කරන්නෝ ද රූප වඳින්නෝ ද සියලු
ආකාර මුසාවාදීහු ද ගින්නෙන්
හා ගෙන්දගමින් දැවෙන විලෙහි
තමන්ගේ විපාකය ලබන්නෝ ය.
එය දෙ වන මරණයයි මට වදාළ
සේක."(එළිදරව් පොත 21;7,8)

## ජීවිතය

බොහෝ අය රුපියල් මිලියන ගණනක ජීවිත රක්ෂණ සහතික මිලදී ගනී. නමුත් මේවායින් ප්‍රයෝජන ලබන්නේ කව්රුන්ද? ඔබ මියගිය පසු ඔබට ඉන් ඇති පලය කුමක්ද?



"දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත් ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කෙළේ උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය."(යොහාන්3:16)

## මෙම ජීවිත රක්ෂණයේ කොන්දේසි

### 1. ඔබ පව්කරුවෙකු බව අවබෝධකරගන්න.

"සියල්ලෝම පව්කොට දෙවියන් වහන්සේගේ ගැළවීමේ මාර්ගයෙන් ඉවත් වී සිටිති."(රෝම 3:23 )

"අපට පාපයක් නැතැ යි කියමු නම් අපි අප ම රවටාගනිමු සත්‍යය ද අප තුළ නැත."(1 යොහාන් 1:8 )



### 2.පාපයේ දඬුවම නිරය බව තේරුම් ගන්න.

"දුදනන්ගේ ඉරණම පාතාලය වේ දෙවිඳුන් අමතක කරන ජාතීන්ටත් එසේ ම වේ."(ගීතාවලිය 9:17 )

### 3. ඔබගේම උත්සාහයෙන් ගැලවීම ලබාගැනීමට බැරිබව වටහාගන්න.



"අපගේ ධර්මිෂ්ට ක්‍රියා කිලිටු වැරහැලි වැනිය."(යෙසායා 64:6)

### 4.පසුතැවිලිවී දෙවියන් වහන්සේට කීකරු වන්න.

"ඉතින් මේ නොදැනුම් කමේ කාලයන් දෙවියන් වහන්සේ නොතකා හැරිය නමුත් දැන් සියලු මනුෂ්‍යයන්ට සියලු තැන්හි පසුතැවී සිත් හරවා ගන්නට දැන් අණ කරන සේක."
(ක්‍රියා 17:30)



## 5.යේසුස් ක්‍රිස්තුස් ගැලවුම්කරු ලෙස අදහාගන්න.

"දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේමකළ සේක් ද කීවොත් ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන්වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කෙළේ උ(න් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය." (යොහාන්3:16 )

## 6.යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ඔබේ පව් කියා දෙන්න.

"එහෙත් අපි පාපෝච්චාරණය කරමු නම් විශ්වාසවන්ත වූ ද ධර්මිෂ්ඨ වූ ද දෙවියන් වහන්සේ සියලු පාපවලින් ද අදමිටුකම්වලින් ද අප පවිත්‍ර කරන සේක."(1 යොහාන් 1:9)

## 7. වතුර බව්තිස්මය සහ ශුද්ධාත්මයානන් වහන්සේ ලබාගන්න.



"ඔබ සියලුදෙනා ම පසුතැවී සිත් හරවා ගෙන පව්කමාව ලබන පිණිස ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ

නාමයෙන් බව්තීස්ම-ස්නාපනය ලබන්න. එවිට ඔබ ශුද්ධාත්ම දීමනාව ලබන්නහු ය.”(ක්‍රියා 2:38 )

## 8 ශුභාරංචියට අනුකූලව ජීවත්වන්න.

“එහෙත් තමන් ම රවටා නොගෙන දහම් පණිවුඩය අසන්නන් පමණක් නොවී එය පිළිපදින්නෝ වන්න.”(යාකොබ් 1:22 )



## ගිවිසුමේ කොන්දේසි

මෙම ගිවිසුම සදාතනිකය. කොපමණ මුදලකට හෝ යහපත් ක්‍රියා වන්ට මෙම මිලය ගෙවිය නොහැක. මිලය ගෙවන ලද්දේ යේසුස්ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේ මියගිය විටදීය. මෙහි වාරිකද අනිකුත් ගෙවීම් සහ ස්මාරක්ෂණය ක්‍රිස්තුස්වහන්සේ කුරුසිපත්වූවිට ගෙවා නිමකරන ලදී. මෙම රක්ෂණ සහතිකය නොමිලේ සැමට උන්වහන්සේගේ අනුග්‍රහය කරුණකොටගෙන දෙනු ලැබේ. (එපිස 2:8 )ඒ සඳහා යේසුස්ක්‍රිස්තුස් වහන්සේ ගැන ස්ථිර ඇදහිල්ලක් ඇතිකරගත යුතුය. (එපිස 3:17)

